රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ ලිපි : 01/2015

මගේ අංකය : EST-7/LEAVE/03/3162
රාජ්‍ය පරිපාලන, පළාත් පාලන හා
ප්‍රජාතාන්ත්‍රීය පාලනය පිළිබඳ අමාත්‍යාංශය
නිදහස් චතුරශ්‍රය
කොළඹ 07.

2015.04.15

අමාත්‍යාංශ ලේකම්වරුන්
පළාත් ප්‍රධාන ලේකම්වරුන්
දෙපාර්තමේන්තු ප්‍රධානීන්.

## ආයතන සංග්‍රහයේ XII වැනි පරිච්ඡේදයේ 16 වගන්තිය සංශෝධනය කිරීම

2014.05.19 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 09/2014 කෙරෙහි ඔබගේ අවධානය යොමු කරවමි.

02. විදේශ ශිෂ්‍යත්වයක් මත උසස් අධ්‍යාපනය සඳහා විදේශගත වන රාජ්‍ය නිලධරයෙකුගේ රාජ්‍ය සේවයේ නියුතු කලත්‍රයාට ද එම නිලධරයා සමඟ විදේශගත වීම සඳහා අදාළ විධිවිධාන ඉහත චක්‍රලේඛය මඟින් සලසා ඇත.

03. එසේම විදේශ ශිෂ්‍යත්වයක් සඳහා සන්නද්ධ සේවාවක හෝ ව්‍යවස්ථාපිත ආයතනයක නිලධරයෙකු නිල වශයෙන් තෝරාගෙන විදේශයකට යැවෙන අවස්ථාවකදී ද එකී නිලධරයාගේ කලත්‍රයා රාජ්‍ය නිලධරයකු වන්නේ නම්, ඔහු හෝ ඇය සම්බන්ධයෙන් ද ඉහත චක්‍රලේඛයේ විධිවිධාන අදාල කොටගත හැක.

ජේ.දඩල්ලගේ
ලේකම්
රාජ්‍ය පරිපාලන, පළාත් පාලන හා
ප්‍රජාතාන්ත්‍රීය පාලනය පිළිබඳ අමාත්‍යාංශය